# 21. දයාවේ මාතාව

තෙරේසා මවුතුමිය දවසක් ඉන්දියාවේ කල්කටා නගරයේ වීදියක් දිගේ ගමන් කරමින් සිටියා. මහලු කාන්තාවක් පාර අයිනේ වැටී සිටියා එතුමිය දැක්කා. ඒ පාරෙන් නිතර ම බොහෝ දෙනා එහාට මෙහාට යනවා. කිසිවෙක් ඒ මහලු කාන්තාව ගැන සොයා බැලුවේ නෑ. තෙරේසා මවුතුමියට හරි ම පුදුමයි. එතුමියගේ සිතට දුකක් දැනුණා. මහලු කාන්තාව ළඟට ගියා. ඇයට සාත්තු කර රෝහලට ගෙන ගියා.



තවත් මෙසේ අසරණ වූ බොහෝ අය කල්කටාවේ ඉන්න බව මවුතුමිය දැනගත්තා. " ඔවුන්ට සලකන්නේ කවුද ?" යන්න ඇය කල්පනා කළා.

මෙතැන් සිට දුප්පත් අසරණ අනාථ අයට සේවය කිරීමට මවුතුමිය පටන් ගත්තා. ඒ සඳහා කන්‍යා සොහොයුරියන් පිරිසක් ද ඇය පුහුණු කළා. ඇය ස්වර්ගයට යනතෙක් ම අසරණ අය වෙනුවෙන් දෙවි පියාට ආදරය කිරීමක් වශයෙන් මේ සේවාව කළා. ඇය පටන් ගත් නිකායේ සොහොයුරියෝ මේ උතුම් සේවය දිගට ම කරගෙන යනවා.

**"අපිත් තෙරේසා මවුතුමිය වගේ අසරණ අයට උදව් කරමු"**
**එසේ උදව් කර දෙවි පියාට ආදරේ කරමු.**

පැවරුම්

1. තෙරේසා මවුතුමිය සේවය කළේ ඉන්දියාවේ කුමන නගරයේ ද ?
2. තෙරේසා මවුතුමිය තම සේවය ලබාදුන්නේ කාට ද?
3. තෙරේසා මවුතුමියගේ නිකායේ කන්‍යාරාම දෙකක් ලංකාවේ ද ඇත. ඒවා පිහිටි ස්ථාන දෙක ගුරුතුමියගෙන් අසා දැනගන්න.
4. දුප්පත් අසරණ අනාථ අය වෙනුවෙන් යාච්ඤා කරන්න.